## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107, 111 වගන්ති සහ 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලියේ 26 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.16,184,771 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 24,329,085 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,144,314 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව විනිමය ගනුදෙනුවලින් ලැබෙන වෙනත් ආදායම් රු.2,133,622කින් අඩුවී තිබීම හා මානව සම්පත් සංවර්ධන වියදම රු.12,507,605 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුල බැඳුම්කර ගිවිසුම් කඩකල පශ්චාත් උපාධි ප්‍රදානලාභීන් 27 දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.77,708,207 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රදානලාභීන් වෙත ගෙවන ලද මුදල් ප්‍රතිපූරණය කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී පාඨමාලා වෙනුවෙන් මුදල් ගෙවා ඒ සඳහා සහභාගී වී නොතිබුණු අයදුම්කරුවන් 19 දෙනෙකුගේ රු.313,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල NCAS ආයතනය විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට යෝජිත පාඨමාලාවක ගාස්තු වන අතර එය පරිගණක රසායනාගාර පහසුකම් සහිතව හැදෑරීමට යොමු වූ හෙයින් එම මුදල විලම්භිත ආදායමක් ලෙස සටහන් කර ඇති බව හා ඔවුන් විසින් මුදල් ඉල්ලා සිටි | අයදුම්කරුවන්ගෙන් අයකරගත්තා මුදල් නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග ගතයුතුය. |

අවස්ථාවකදී ගෙවිය යුතු හෝ පාඨමාලාව ආයතනික මට්ටමින් පවත්වනු ලබන අවස්ථාවෙහිදී ඔවුන්ට පෙර දැනුම් දීමකින් යුතුව පාඨමාලාව සඳහා සහභාගි කරවා ගත යුතුව ඇති බව.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024-2028 සංයුක්ත සැලැස්මෙහි 06 වන ඉලක්කය වන විශ්වවිද්‍යාල පද්ධතියේ සහ අනෙකුත් වෘත්තීය ආයතනවල පරිපාලන කාර්යමණ්ඩලයේ ධාරිතාව වැඩි දියුණු කිරීම, 2024 සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙන් ඉවත් කර තිබුණි. | ඉතා සීමිත මානව සම්පත් ප්‍රමාණය හා ආයතනයේ ප්‍රමුඛ ඉලක්කය වන අධ්‍යයන කාර්යය මණ්ඩල ප්‍රවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතු හෙයින් මෙම 6වන ඉලක්කය ඉවත් කිරීමට තීරණය කරන ලද බව. | ආයතනයේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනීම සඳහා ස්ථාපිත කරන ලද ඉලක්කයන් ලඟා කරගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ උනන්දුවක් දක්වන අධ්‍යයන/වෘත්තීය උපාධිධාරීන් පර්යේෂණ කටයුතු සඳහා පුහුණු කිරීම හා දිරිමත් කිරීම සඳහා පවත්වන ලද කෙටි පාඨමාලා දැනුවත් කිරීමේ වැඩමුළු 18ක් සැළසුම් කළ ද ඉන් 14ක් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | විශ්වවිද්‍යාල අනධ්‍යයන සහ විධායක ශ්‍රේණිවලට අයත් නිලධාරීන් විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලද වැඩ වර්ජනය, අතිරික්ත සේවා රාජකාරි කිරීමට සිදු වීමෙන් වැඩමුළුවලට සහභාගි වීමට තිබූ නොහැකියාව සහ ආයතනයේ ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් පාඨමාලා වැඩමුළු යනාදිය අපේක්ෂිත ආකාරයෙන් පැවැත්වීමට නොහැකි විය. | අපේක්ෂිත ඉලක්කයන් ලඟා කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | භාෂා ප්‍රවීණතා හා පෞරුෂත්ව සංවර්ධනය සඳහා අයදුම්කරුවන් 75 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වැඩසටහන් 03ක් පැවැත්වීමට සැලසුම් කලද 2024 වර්ෂය අවසාන වන විටත් එම වැඩසටහන් පැවැත්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රමාණවත් යටිතල පහසුකම් අත්පත් කරගැනීමට නොහැකි වීම හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපහසු විය. | පවත්නා සුදුසුකම් යටතේ ඉලක්කයන් ලගා කර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කල යුතුය. |